# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## ඉඩම් අමාත්‍යාංශය

## අභ්‍යන්තර විගණක තනතුර සඳහා ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩුව පවතින කළමනාකාර සේවා ගණයෙහි අභ්‍යයන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. තනතුර** : අභ්‍යන්තර විගණක

1.1. තනතුරු සංඛ්‍යාව : 01

**2. වැටුප් පරිමාණය** : **53175/- 1375x10-1910x15-95575/=**

2.1 මාසික මූලික වැටුප : 53175/=

**3. වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

**4. සුදුසුකම්**

4.1 බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ්‍ය පිළිබඳ ප්‍රථම උපාධිය

**හෝ**

වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ පිරිවැය හා කළමනාකාරීත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) අන්තර් මධ්‍යම මට්ටම සමත්වීම

**සහ**

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු පිළිබඳ වසර තුන (03) ක පළපුරුද්ද

4.2 **අභ්‍යන්තර අයදුම්කරුවන්**

කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ ගිණුම් නිලධාරී තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් ලබාතිබීම

5. ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රයක් අදාළ සහතිකවල පිටපත් ද සහිතව 2021.05.04 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

6. සියලුම අයදුම්කරුවන්ගේ විස්තර ලුහුඩු ලැයිස්තු ගත කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7. රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව තෝරාගත හොත් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය.

8. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

**සභාපති,**
**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,**
**අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.**
**2021.04.19**